# ශ්‍රී ලංකාවේ කෞතුකාගාර ප්‍රවර්ධනය කිරීම මගින් සංචාරක ආකර්ෂණය ශ්‍රී ලංකාව වෙත ලබා ගත හැකි වීම පිළිබඳ අධ්‍යනයක්

ආර්.ඩබ්ලිව්. සසිනි චමුදිකා රාජසේකර*

ඉතා පැරණි ඉතිහාසයක් හිමි ශ්‍රී ලංකාව සතු වූ ඉතා වටිනා පැරණි මතකයන් රැසක් එක විට දැක ගත හැකි ස්ථාකයක් ලෙස කෞතුකාගාරය හැඳින්විය හැකිය. ශ්‍රී ලංකාවේ කෞතුකාගාර රැසක් පැවතුනද ඒ පිළිබඳ විදෙස් සංචාරකයින් පමණක් නොව දේශීය සංචාරකයින්ද ඉතා සුළු ප්‍රමාණයක පමණක් දැනුවත් වී ඇත. මෙම තත්වය මඟහරවා ගැනීම උදෙසා කෞතුකාගාරය මගින් ප්‍රවර්ධන වැඩසටහන් දියත් කළ යුතු බව මෙමගින් සනාථ වේ. එහෙත් වර්තමානය වනවිට දෙස් විදෙස් සංචාරකයින් තුළ ශ්‍රී ලංකාවේ කෞතුකාගාර පිළිබඳ පවතින්නේ ඉතා දුර්වල අදහස් වේ. මේ තත්වය මඟහරවා ගැනීම උදෙසා අධ්‍යාපනික වැඩමුළු, විනෝදකාමී වැඩමුළු, තාවකාලික ප්‍රදර්ශන, සංචාරකයින්හට විශේෂ පහසුකම් ලබා දීම වැනි ක්‍රම භාවිත කළ යුතු වේ.

මෙවැනි ප්‍රවර්ධන ක්‍රම භාවිත කිරීම මෙන්ම වාර්තමානයේ නව ප්‍රවර්ධන ක්‍රමයක් ලෙස හඳුනාගෙන ඇති අන්තර්ජාලය සහ සමාජ වෙබ් අඩවි මගින් ද ශ්‍රී ලංකාව සතුව ඇති කෞතුකාගාර සහ විශේෂ පහසුකම් පිළිබඳ වූ ප්‍රවර්ධන වීඩියෝපට, දැනුවත් කිරීමේ පත්‍රිකා වැනි මෙවලම් භාවිත කරමින් දෙස් විදෙස් සංචාරකයින්හට කෞතුකාගාරයක ඇති වැදගත්කම හා වටිනාකම් පෙන්වා දී කෞතුකාගාර වෙත ගෙන්වා ගතහැකි වන බව මෙම පර්යේෂණය මගින් සනාථ වේ. තවද මෙමගින් සංචාරක කර්මාන්තය වර්ධනය වී රටේ ආර්ථිකය ද වර්ධනය කළ හැකිවේ.

ප්‍රවර්ධනය මගින් වර්තමානයේ ශ්‍රී ලංකාවේ කෞතුකාගාර පිළිබඳ සංචාරකයා තුළ ඇති ප්‍රතිරූපය වෙනස්කර නව ප්‍රතිරූපයක් නිර්මාණය කිරීම සිදු කළ හැකිවේ. මෙමගින් සංචාරකයාහට කෞතුක භාණ්ඩ හා ඒ කාල වකවානු පිළිබඳ නිසි අධ්‍යාපනයක් ලබා දිය හැකි අතර නවතම වූ අත්දැකීම් ලබා දීමට ද කටයුතු සැලැස්විය හැකිය. මීට සරිලන ලෙස ශ්‍රී ලංකාවේ කෞතුකාගාර නිර්මාණය කිරීමද වැදගත්වේ. සංචාරක අවශ්‍යතා සපුරා ගත හැකි ආකාරයට කෞතුකාගාරය නිර්මාණය කිරීමත්, ඒ පිළිබඳ ප්‍රවර්ධනය කිරීමත් මගින් ශ්‍රී ලංකාව වෙත සංචාරක ආකර්ෂණය ලබාගත හැකිවේ. මෙමගින් සංචාරක කර්මාන්තය දියුණු කර ගත හැකි බව ද සනාථ වේ.

ප්‍රමුඛ පද : කෞතුකාගාර, සංචාරකයා, ප්‍රවර්ධනය, ශ්‍රී ලංකාව, සංචාරක කර්මාන්තය

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය sasichamudi@gmail.com